ලංකාව

ලංකා පාර්ලිමේන්තුව

1951කේ 4වෙනි වාරය

# 1951කේ අංක 13 දරන

# මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත

**1951කේ අප්‍රේල් මස 5වෙනි දින අනුමතකරන ලදී**


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයෙහි මුද්‍රාපිතයි

කොළඹ ආණ්ඩුවේ පොත්පත් ආයතනයෙන් මිල දී ලබාගත හැකිය

1952

මිල : රු. 1.30යි          තැපැල් ගාස්තුව : ශත 30යි

51කෝ අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත

පටුන

(වගන්)තිය

1. ලුහුඬු නාමය හා වලංගු වන දිනය.
2. පනත අදාළ වීම.

## I වෙනි කාණ්ඩය

### ප්‍රාරම්භය

3. රිජිස්ට්‍රාර් ජනරාල්තැනගේ සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ පරිපාලන බල.
4. මුස්ලිම් විවාහ හා දික්කසාද උපදේශක මණ්ඩලය.
5. මණ්ඩලයට අයත් පත් කරන ලද සාමාජිකයෝ.
6. මණ්ඩලයේ කටයුතු.
7. මණ්ඩලයෙහි රැස්වීම්.
8. මුස්ලිම් විවාහ ලේකම්වරු.
9. තාවකාලික ලේකම්වරු.
10. විශෙෂ ලේකම්වරු.
11. පත් කරනු ලැබූ ප්‍රදේශයෙන් පිටතදී විවාහ ලියා පදිංචිකිරීම.
12. ක්වාසිවරු.
13. තාවකාලික ක්වාසිවරු.
14. විශෙෂ ක්වාසිවරු.
15. ක්වාසි මණ්ඩලය.

## II වෙනි කාණ්ඩය

### විවාහ ලියා පදිංචි කිරීම

16. මුස්ලිම් විවාහ වලංගු වීම හෝ අවලංගු වීම.
17. විවාහය ලියා පදිංචි කරවීමේ යුතුකම.
18. ප්‍රකාශය සහ ලියා පදිංචි කිරීමේ ආකෘතිය.
19. විවාහ පිළිබඳ සටහන් අත්සන් කොට සහතික කළ යුතු බව.
20. විවාහ ලියා පදිංචි කොට පිළිවෙළින් අංක කළ යුතු බව.
21. විවාහයේදී ලේකම්ගේ පැමිණීම.
22. "ඉද්දත්" කාලය තුළදී විවාහයක් ලියා පදිංචි නො කළ යුතු බව.
23. දොළොස් විය නො පැමිණි බාලිකාවකගේ විවාහය ක්වාසි තැනගේ අවසරය නොමැතිව ලියා පදිංචි නොකළ යුතු බව.
24. දෙවෙනි වරට හෝ ඊට පසුව කර ගන්නා විවාහය.
25. ෂාෆි නිකායට අයත් ස්ත්‍රීන්ගේ විවාහ පිළිබඳ ප්‍රකාශය.
26. මනාලියගේ වාලි.

—J. N. B 17511—905 (5/52)

III වෙනි කාණ්ඩය

**දික්කසාද ලියා පදිංචි කිරීම**

27. ස්වාමිපුරුෂයා විසින් දික්කසාද කිරීම.

28. භාර්යාව විසින් දික්කසාද කිරීම.

29. දික්කසාද ලියා පදිංචි කිරීම.

IV වෙනි කාණ්ඩය

**කලින් සිදු කරන ලද දික්කසාද සඳහා ද නැවත සිදු කරන විවාහ සඳහා ද විශෙෂ විධිවිධාන**

30. දික්කසාද ඔප්පු කිරීමට ඇති සාක්ෂි ප්‍රමාණවත් නො වන අවස්ථාවලදී දික්කසාද ලියා පදිංචි කරන ක්‍රමය.

31. දික්කසාදයක් හෝ, නැවත විවාහවීමක් ලියා පදිංචි කිරීමේ ප්‍රතිඵල.

32. ලියා පදිංචි නොකර හරින ලද විවාහ හා දික්කසාද ලියා පදිංචි කිරීමට ඇති බලය සහ වැරදි ලෙස ලියා පදිංචි කිරීම් නිවැරදි කිරීම.

33. ලියා පදිංචි කිරීමක වැරදි නිවැරදි කිරීම.

V වෙනි කාණ්ඩය

**නඩත්තුව "මහාරය" සහ "කයිකූලිය" පිළිබඳ විධිවිධාන**

34. භාර්යාවගේ නඩත්තුව පිළිබඳ ඉල්ලීම්.

35. දරුවෙකුගේ නඩත්තුව සඳහා ඉල්ලීම්.

36. ඉල්ලීමක් කරන දිනයේ සිට නඩත්තු මුදල ගෙවීමට කරනු ලබන නියෝග.

37. මහාරය හෝ කයිකූලිය ඉල්ලීමේදී ස්ත්‍රියක වෙනුවෙන් පෙනී සිටීම.

38. 37 වෙනි වගන්තිය යටතේ අනිකෙකු පෙනී සිටිමින් ඉල්ලුම් කොට ක්වාසි කෙනෙකු විසින් ලබාගන්නා ලද මුදල්වලට කුමක් කළ යුතු ද යන්න.

39. "මහාරය" සඳහා නඩු පැවරීමේ කාල සීමාව.

VI වෙනි කාණ්ඩය

**රිජිස්ත්‍රාර් ජනරාල්තැනගෙ ද, දිස්ත්‍රික් ලේකම් වරුන්ගේ ද, ක්වාසි මණ්ඩලයේ ද, ලේකම් වරුන්ගේ ද බලතල හා යුතුකම්**

40. ලේකම් පොත් පරීක්ෂා කිරීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඇති බලය.

41. 52 වෙනි වගන්තිය යටතේ ගෙවන ලද මුදල් යෙදවීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඇති බලය.

42. ක්වාසිවරුන්ගේ ලේඛන සටහන් පිටපත් බැඳ තැබවීම නියම කිරීම දිස්ත්‍රික් ලේකම්තැනගේ යුතුකම බව.

43. ලේඛන ගෙන්වා ගැනීමට ක්වාසි මණ්ඩලයට ඇති බලය.

44. ක්වාසි මණ්ඩලයට අයත් සංශෝධන බලතල.

45. මුස්ලිම් නීතිය පිළිබඳ ප්‍රශ්නවලදී රිජිස්ට්‍රාර් ජනරාල්තැන වෙත සිය අදහස් දන්වා සිටීම ක්වාසි මණ්ඩලයේ යුතුකම බව.

46. ක්වාසි කෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද නීති ප්‍රශ්න පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කිරීම ක්වාසි මණ්ඩලයේ යුතුකම බව.

47. ක්වාසිවරුන්ගේ සාමාන්‍ය බලතල.

48. 47 වෙනි වගන්තියේ දක්වන කරුණු විභාග කිරීමට ක්වාසි කෙනෙකුට අනන්‍ය අධිකරණ බලය ඇති බව.

49. ක්වාසිවරුන්ගේ ධුරය පිළිබඳ දිවුරුම් ගැනීම.

50. දිවුරුම් දිවරවීමට ක්වාසි කෙනෙකුට ඇති බලය.

51. ක්වාසිවරු ආරක්ෂක ඔප්පුවලට ඇතුළත් විය යුතු බව.

52. ලබන ලද හා ගෙවන ලද මුදල් පිළිබඳ ලේඛනයක් ක්වාසිවරුන් විසින් තැබිය යුතු බව.

53. 38 වෙනි වගන්තිය යටතේ තැන්පත් කරන ලද හෝ ආපසු ගන්නා ලද මුදල් පිළිබඳව ක්වාසිවරුන් විසින් දිස්ත්‍රික් ලේකම්තැනට වාර්තා කළ යුතු බව.

54. සටහන්වල පිටපත් හා සූචි ලේඛන ද ක්වාසිවරුන් විසින් මාස් පතා දිස්ත්‍රික් ලේකම්වරුන්ට යැවිය යුතු බව.

55. පොත් හා ලේකම් පොත පිළිබඳව සූචි ලේඛන ක්වාසිවරුන් හා ලේකම්වරුන් විසින් තැබිය යුතු බව.

56. ලේකම් පොත් ආදිය ක්වාසිවරුන්ගේ හා ලේකම්වරුන්ගේ භාරයේ තැබිය යුතු බව.

57. මුස්ලිම් උපදේශකයෙකුගේ දිවුරුම.

58. විවාහ හා දික්කසාද ලේකම් පොත්වල දෙවෙනි පිටපත දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යැවීමේ යුතුකම.

59. ලේකම්වරුන් විසින් අය කළ යුතු ගාස්තු.

VII වෙනි කාණ්ඩය

ඇපැල් ගැනීම

60. ක්වාසිවරුන්ගේ ආඥාවලට විරුඬව ඇපැල් ගැනීම.

61. රිජිස්ට්‍රාර් ජනරාල්තැනගේ හෝ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හෝ නියෝගවලට විරුඬව ඇපැල් ගැනීම.

62. ශ්‍රෙෂ්ඨාධිකරණයට ඇපැල් ගැනීම.

63. කාලසීමාව ඉකුත්වීම් ආදියක් සිදු වීමෙන් පසුව ද ඇපැල් ගැනීම.

## VIII වෙනි කාණ්ඩය

### ආඥා ක්‍රියාවෙහි යෙදවීම

64. "මහාර" සඳහා හෝ "කයිකූලි" සඳහා හෝ නොව 47 වෙනි වගන්තිය යටතේ වෙනත් ඉල්ලීම්වලට අයවිය යුතු මුදල් අයකර ගැනීම.

65. "මහාර" හෝ "කයිකූලි" පිළිබඳවූ ඉල්ලීම්වලදී අයවියයුතු මුදල් ලබාගැනීම.

66. නඩත්තුව සඳහා කරන ලද ආඥා කඩකිරීමේදී ඇතිවිය යුතු ක්‍රියා පරිපාටිය.

## IX වෙනි කාණ්ඩය

### සාමාන්‍ය

67. විභාගයක් එක් ක්වාසි කෙනෙකුගෙන් තවත් කෙනෙකුට මාරු කිරීම.
68. ලේකම් පොත් හා සූචි ලේඛන පරීක්ෂණය පිණිස තැබිය යුතු බව.
69. කලින් වලංගුව තිබුණ නීති යටතේ තබන ලද ලේඛන පරීක්ෂා කිරීම පිණිස තැබිය යුතු බව.
70. ලේකම් පොත් හා පිටපත් සාක්ෂි බව.
71. විවාහ ලේකම් පොතෙහි හෝ දික්කසාද ලේකම් පොතෙහි සටහනක් හොඳම සාක්ෂ්‍යය බව.
72. පොත් ආදිය නොමිලයේ සැපයිය යුතු බව.
73. ක්වාසි මණ්ඩලයේ සභිකයන් ද එම මණ්ඩලයෙහි ලේකම්ද, ක්වාසිවරුන් ද රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.
74. ක්වාසිවරුන් ඉදිරිපිට පාර්ශවකාරයින් සහ සාක්ෂිකාරයින් වෙනුවෙන් පෙනී සිටීම.
75. පොලිස් නිලධාරීන් විසින් හා ගම් මුලාදෑනීන් විසින් ක්වාසි වරුන්ට උපකාර කිරීමේ යුතුකම.
76. ලේකම්වරුන් විසින් සාදන ලද සටහන්වල දෙවෙනි පිටපත් නැතිවීම.
77. ලේකම් පොත්වල ලිපි දෝෂ ශුද්ධකිරීම.
78. ආකෘති පත්‍ර.

## X වෙනි කාණ්ඩය

### වැරදි සහ දඬුවම්

79. ලේකම් පොත් ආදිය නැති කර දැමීම ගැන දඬුවම්.
80. ව්‍යභිචාරී විවාහ ආදිය ගැන දඬුවම.
81. විවාහ දික්කසාද ආදිය පිළිබඳ වැරදි සඳහා දඬුවම්.
82. 22 වෙනි වගන්තිය හෝ 23 වෙනි වගන්තිය හෝ 24 වෙනි වගන්තියේ (4) වෙනි උපවගන්තිය හෝ කඩකිරීමෙන් විවාහ ලියා පදිංචි කිරීම ගැන දඬුවම්.

83. බලය නොමැතිව විවාහ දික්කසාද ආදිය ලියා පදිංචි කිරීම ගැන දඬුවම.

84. ක්වාසි කෙනෙකු විසින් මුදල් අයිතිකාරයෙකුට එය නොගෙවා පැහැර හැරීම ගැන දඬුවම.

85. ප්‍රකාශයක අසත්‍ය කිසිවක් ඇතුලත් කිරීම ගැන දඬුවම.

86. ලේකම්වරුන් විසින් සිය යුතුකම් ඉටු නො කිරීම ගැන දඬුවම.

87. 'ඉද්දත්' කාලය තුලදී කරගන්නා ලද විවාහයක් ලියා පදිංචි කිරීම ගැන දඬුවම.

88. දිස්ත්‍රික් ලේකම්තැනට ලේකම් පොත් ආදිය භාර නො දීම ගැන දඬුවම.

89. නඩු කියන්නන් සමග මැදහත් වීම ගැන දඬුවම.

90. 75 වෙනි වගන්තියෙන් පැවරී තිබෙණ යුතුකම් පැහැර හැරීම ගැන දඬුවම.

91. ලේකම් පොත අත්සන් කිරීමට හෝ අවශ්‍ය මුද්දර සැපයීමට හෝ බැරිය යි කීම ගැන දඬුවම.

92. සාමාන්‍ය දඬුවම.

93. ක්වාසි මණ්ඩලය හෝ ක්වාසි කෙනෙකු හෝ විභාගයක් පැවැත්වීමේදී අනිසි ලෙස හැසිරීම.

## XI වෙනි කාණ්ඩය

### අතිරේක විධිවිධාන

94. නියෝග.

95. සිවිල් අධිකරණවල නඩු පැවරීම මෙයින් අත්හැරීම.

96. දිස්ත්‍රික් ලේකම් කෙනෙකු ගැන සඳහන් කිරීම තේරුම් ගැනීම.

97. පදණ.

## XII වෙනි කාණ්ඩය

### අවලංගුකිරීම්, අත්හැරීම් හා අස්ථිර විධිවිධාන

98. අවලංගු කිරීම.

99. විවාහ හා දික්කසාද පිළිබඳ මුස්ලිම් නීතිය ආරක්ෂා කර ගැනීම.

100. අත්හැරීම්.

පළමුවෙනි උපලේඛනය.

දෙවෙනි උපලේඛනය.

තුන්වෙනි උපලේඛනය.

හතරවෙනි උපලේඛනය.

පස්වෙනි උපලේඛනය.

# 1951කේ අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත

ලංකාවේ පදිංචි මුස්ලිම්වරුන්ගේ විවාහ හා දික්කසාද සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු සඳහාද, විශේෂයෙන්ම එබඳු විවාහ හා දික්කසාද ලියාපදිංචි කිරීම සඳහා ද වූ පනතකි.

[අනුමත කළ දිනය: 1951 අප්‍රේල් 5 වෙනිදා.]

ලංකාවේ මෙම පාර්ලිමේන්තුවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් ලබනලද අනුශාසනය හා අනුමතිය ඇතිව, එහිම බලය පිට නෛකශ්‍රීන් විරාජමාන මහරජතුමන් විසින් මෙසේ පනවනලදී :—

1. මෙම පනත 1951කේ අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනතයයි හැඳින්විය හැකිය. මෙය, ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි ආඥාවක් පළකිරීමෙන් නියමිත දිනයක වලංගු වන්නේය. *ලුහුඬු නාමය හා වලංගුවන දිනය.*

2. ලංකාවේ පදිංචි මුස්ලිම්වරුන්ගේ විවාහ, දික්කසාද සහ එයට සම්බන්ධවූ වෙනත් කරුණුවලට පමණක් මෙම පනත අදාළ වන්නේය. *පනත අදාළවීම.*

## I වෙනි කාණ්ඩය

### ප්‍රාරම්භය

3. මෙම පනත යටතේ විවාහ හා දික්කසාද ලියා පදිංචිකිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය පාලනය හා පරිපාලනය රිජිස්ත්‍රාර් ජනරාල් තැන විසින් ඇමතිවරයාගේ නියමවලට යටත්ව කළ යුතුය. තවද තමන්ගේ දිස්ත්‍රික්කයෙහි එබඳු විවාහ හා දික්කසාද පාලනය හා පරිපාලනය රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ නියමවලට යටත්ව, සෑම දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින්ම කළ යුතුය. *රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ සහ දිස්ත්‍රික් ලේකම් වරුන්ගේ පරිපාලක බළ.*

4. (1) මෙම පනතේ කාර්යයන් සඳහා "මුස්ලිම් විවාහ හා දික්කසාද උපදේශක මණ්ඩලය" යන නමින් මණ්ඩලයක් පිහිටුවනු ලැබේ. *මුස්ලිම් විවාහ හා දික්කසාද උපදේශක මණ්ඩලය.*

(2) එම මණ්ඩලය, එවකට රිජිස්ත්‍රාර් ජනරාල් ධුරය දරන තැනැත්තාගෙන්ද, ඇමතිවරයා විසින් පත්කරනුලබන, සතර දෙනෙකුට අඩු නොවන්නාවූත් නවදෙනෙකුට වැඩි නොවන්නාවූත්, මින්මතු "පත්කරනලද සභිකයන්" යයි කියනුලබන මුස්ලිම්වරුන් සංඛ්‍යාවකින්ද සමන්විත වියයුතුය. මෙම මණ්ඩලයෙහි සභාපති ධුරය දැරිය යුත්තේ රිජිස්ත්‍රාර් ජනරාල්තැනය.

මණ්ඩලයට අයත් පත් කරනලද සාමාජිකයෝ.

5. (1) මුස්ලිම් විවාහ හා දික්කසාද උපදෙශක මණ්ඩලයෙහි පත්කරනලද සෑම සභිකයෙක්ම, කලින් සභිකත්වයෙන් ඉල්ලා අස්නොවුණු විටක හෝ ඇමතිවරයා විසින් නිලයෙන් පහනොකළ විටක හෝ එම සාමාජිකයා පත්කිරීමේදී ඇමතිවරයා විසින් නියම් කරනු ලබන පරිදි අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සිය ධුරය දරන්නේය.

(2) ධුර කාලය අවසන්වීමෙන් ධුරය හිස්කරන්නාවූ පත්කරනලද සභිකයෙක් නැවතද පත්කරනුලැබීමට සුදුසු වන්නේය.

(3) පත්කරනලද සභිකයෙකු මණ්ඩලයෙන් කලින් අවසර නොලබා මණ්ඩලයේ රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණි බව ඇමතිවරයා පිළිගතහොත් ඔහු ධුරයෙන් පහකිරීමට ඇමතිවරයාට පිළිවන.

එසේවූවද, පත්කරනලද සභිකයෙකු අන්කිසි කරුණක් සඳහා ධුරයෙන් පහකිරීමට ඇමතිවරයාට ඇති බලය, මෙම උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලින් සීමාවූවක් ලෙස නොසැළකිය යුතුය.

මණ්ඩලයේ කටයුතු.

6. මෙම පනත ක්‍රියාවෙහි යෙදවීමේදී ඇතිවන සියලු කරුණු පිළිබඳවද නැතහොත් උපදෙස් දීමට යෝග්‍යයයි මණ්ඩලය විසින් සලකන කරුණු සම්බන්ධවද රිජිස්ත්‍රාර් ජනරාල්තැනට උපදෙස් දීම මුස්ලිම් විවාහ හා දික්කසාද උපදේශක මණ්ඩලයෙහි කාර්‍ය්‍යය වන්නේය.

මණ්ඩලයෙහි රැස්වීම්.

7. (1) මුස්ලිම් විවාහ හා දික්කසාද උපදේශක මණ්ඩලයේ සභාපති පැමිණ සිටින සියලු රැස්වීම්වලදීම, ඔහු මූලාසනය දැරිය යුතුය. සභාපතිතැන නොපැමිණි අවස්ථාවලදී රැස්වීමේ මූලාසනය සඳහා පැමිණ සිටින සභිකයන්ගෙන් කෙනෙකු පත් කර ගත යුතුය.

(2) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සතරදෙනෙකු විය යුතුය.

(3) මණ්ඩලයේ ලේකම් ධුරයට හෝ එහි වැඩ බැලීමට තම ආයතනයෙන් නිලධාරියෙකු පත්කිරීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන. මණ්ඩලයේ එක් එක් රැස්වීමේ වාර්තා තැබීම එකී ලේකම් තැනගේ යුතුකම වන්නේය.

(4) මෙම ආඥාපනතෙහි විධිවිධානවලට හා ඒ යටතේ සාදනලද නියෝගවලටද යටත්ව මණ්ඩලයෙහි කාර්‍ය්‍ය පරිපාටිය සංවිධාන කිරීම මණ්ඩලයට පිළිවන.

මුස්ලිම් විවාහ ලේකම්වරු.

8. (1) මුස්ලිම් විවාහ ලේකම් කෙනෙකු පත්කිරීම සඳහා ඉල්ලීමක් කළ විටක එම පනත යටතේ විවාහ ලියා පදිංචිකිරීමට සුදුසුයයි තමන්ට හැඟෙන මුස්ලිම් පුරුෂයෙකු පත්කිරීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන. තවද නියමිත ගාස්තුව ගෙවූවිට පත්කිරීමේ අක්තයද ඔහු වෙත නිකුත් කළ හැකිය.

(2) මෙම වගන්තිය යටතේ යම්කිසි දිස්ත්‍රික්කයක් වෙනුවෙන් පත්කළහැකි ලේකම්වරුන්ගේ සංඛ්‍යාව රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ අභිමතය පරිද්දෙන් විය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ නිකුත්කරනුලබන සෑම අක්තයම මුල් පත්‍රය හා උප පත්‍රය වශයෙන් සෑදූ මෙහි පළමුවෙනි උප ලේඛනයෙහි සඳහන් "ඔ" ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ යුතුය. තවද අක්තයෙහි සඳහන් තැනැත්තාට මෙම පනත යටතේ විවාහ ලියා පදිංචිකිරීමට බලය දී තිබෙණ ප්‍රදේශයද එහි සඳහන් විය යුතුය.

(4) මෙම වගන්තිය යටතේ නිකුත්කරනුලබන අක්තය සඳහා නියමිත ගාස්තුව මුද්දරවලින් ගෙවිය යුතුය. එය ඉල්ලුම්කරු විසින් සපයනලදුව රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් උප පත්‍රයෙහි අලවා යථාපරිදි අවලංගු කළ යුතුය.

(5) මෙම වගන්තිය යටතේ පත්කරනලද ලේකම්වරුන් පිළිබඳ ලේඛනයක් සෑදූ රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ කාර්‍යාලයෙහි ප්‍රවේසම්කොට තැබිය යුතුය.

(6) මෙම වගන්තිය යටතේ පත්කරනලද සෑම ලේකම් කෙනෙක්ම සිය අක්තයෙහි සඳහන් පරිදි විවාහ ලියා පදිංචි කිරීමට ඔහුට බලය දී තිබෙණ ප්‍රදේශයෙහි පදිංචිව සිටිය යුතුය.

(7) මෙම වගන්තිය යටතේ කරනලද පත්කිරීමක්, තමන්ගේ අභිමතය පරිදි ආඥවකින් අවලංගුකොට එබඳු පත්කිරීමක අක්තය ආපසු ගෙන්වාගැනීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන.

9. 8වෙනි වගන්තිය යටතේ පත්කරනලද ලේකම් කෙනෙකු විවාහ ලියා පදිංචිකිරීමට බලයලත් ප්‍රදේශයෙන් තාවකාලිකව පිටවී සිටිනවිටද නැතහොත් අසනීපයක් නිසා හෝ වෙන කිසි සෑහෙන කරුණක් නිසා හෝ මෙම පනත යටතේ තමා වෙත පැවරී තිබෙණ යුතුකම් ඉටුකිරීමට තාවකාලිකව ඔහුට නුපුළුවන්වන විටද එම ලේකම් වෙනුවෙන් වැඩබැලීමට ඒ සඳහා සුදුසු මුස්ලිම් පුරුෂයෙකු අක්තයේ සඳහන් කරනුලබන කාලයක් සඳහා පත්කරමින් අක්තයක් නිකුත්කිරීමට දිස්ත්‍රික් ලේකම්තැනට පිළිවන. තාවකාලික ලේකම්වරු.

මේ වගන්තිය යටතේ නිකුත්කරනුලබන සෑම අක්තයක්ම මුද්දර ගාස්තුවෙන් නිදහස් වියයුතුය. තවද එය වලංගුවන්නේ එහි සඳහන් කාලය තුළදී පමණකි.

10. (1) 8වෙනි, 9වෙනි වගන්ති යටතේ නොව, විවාහ ලේකම් කෙනෙකු පත්කිරීමට විශෙෂ අවශ්‍යතාවයක් ඇතිවන විටක එසේ ලේකම්කෙනෙකු පත්කිරීම සඳහා ඉල්ලීමක් කළ කල්හි එම පනත යටතේ විවාහ පදිංචිකිරීමට සුදුසුයයි තමන්ට හැගෙන මුස්ලිම් පුරුෂයෙකු පත්කිරීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන. තවද නියමිත ගාස්තුව ගෙවූවිට නියමිත ආකෘතියට අනුව පත්කිරීමේ අක්තයද ඔහු වෙත නිකුත්කළහැකිය. විශෙෂ ලේකම්වරු.

(2) මුලු දිවයිනම වෙනුවෙන් හෝ විශෙෂ ප්‍රදෙශයක් වෙනුවෙන් හෝ විශෙෂ ලේකම් කෙනෙකු මෙම වගන්තිය යටතේ පත්කළ හැකිය. එහෙත් එබඳු එක් එක් පත්කිරීමකදී පවරනුලැබූ බලය පාවිච්චිකිරීම ඒ ඒ පත්කිරීම සම්බන්ධයෙන් රිජිස්ත්‍රාර් ජනරාල්තැන

විසින් නියමකළහැකි කරුණුවලට හෝ අවස්ථාවලට සීමාව ද නැතහොත් නියමකළහැකි සීමාවල හා නියමවලට යටත්ව ද විය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ නිකුත්කරනුලබන සෑම අක්තයක්ම මුල් පත්‍රය හා උප පත්‍රය වශයෙන් සෑදිය යුතුය. තවද කුමන ප්‍රදේශයක් සඳහා පත්කරන ලද්දේද, පත්කිරීමෙන් පැවරෙන බලය පාවිච්චිකළයුත්තේ කුමන කරුණුවලදී හෝ අවස්ථාවන්හිදීද නැතහොත් කවර නියම හෝ සීමාවලට යටත්ව ද යන්න එහි සඳහන් වියයුතුය.

(4) මෙම වගන්තිය යටතේ නිකුත්කරනුලබන අක්තයේ ගාස්තුව මුද්දරවලින් ගෙවියයුතුය. එය ඉල්ලුම්කරු විසින් සපයනලදුව, රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් උප පත්‍රයෙහි අලවා යථාපරිදි අවලංගු කළයුතුය.

(5) මෙම වගන්තිය යටතේ පත්කරනලද විශෙෂ ලේකම්වරුන් පිළිබඳ ලෙඛනයක් සාදා රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ කායර්‍යාලයෙහි ප්‍රවේසම්කොට තැබිය යුතුය.

(6) තමාගේ අක්තයෙහි සඳහන්කරනලද කරුණුවලට හෝ අවස්ථාවලට හෝ බාහිරවූ ද, නියමවලට සහ සීමාවලට එකඟ නොවන ලෙස ද මේ වගන්තිය යටතේ පත්කරනුලැබූ විශෙෂ ලේකම් කෙනෙකු කිසි විවාහයක් ලියා පදිංචි නොකළ යුතුය.

(7) මෙම වගන්තිය යටතේ කරනලද පත්කිරීමක්, තමන්ගේ අභිමතය පරිදි ආඥාවකින් අවලංගුකොට එබඳු පත්කිරීමක අක්තය ආපසු ගෙන්වාගැනීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන.

පත්කරනු ලැබූ ප්‍රදේශයෙන් පිටතදී විවාහ ලියා පදිංචි කිරීම.

11. තමා වෙත නිකුත්කරනලද අක්තයේ සඳහන් ප්‍රදේශයේ සීමාවලින් පිටතදී කරගන්නාලද කිසි විවාහයක් මින්මතු දක්වෙන කරුණුවලට යටත්ව මිස 8වෙනි හෝ 9වෙනි වගන්තිය යටතේ පත්කරනුලැබූ ලේකම්කෙනෙකු විසින් ලියා පදිංචි නොකළ යුතුය.

එසේදවුවත්, මනාලයාද, මනාලිය අයත් කොට්ඨාශය පාලනය කරනුලබන මුස්ලිම් නීතිය අනුව "වාලි" කෙනෙකු අවශ්‍යවූවිට, මනාලියගේ වාලිද, ඒ සඳහා ඉල්ලීමක් කළවිට, නියමිත ගාස්තුව ගෙවූ කල්හි එම විවාහය ලියා පදිංචිකිරීම පිණිස අන්‍ය ප්‍රදේශයක ලේකම්කෙනෙකුට තමාගේ අභිමතය පරිදි ලිපියකින් බල පැවරීමට, රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන.

ක්වාසිවරු.

12. (1) යහපත් චරිතයක්ද, තත්ත්වයක් හා සුදුසු තනතුරක්ද දරන්නාවූ මුස්ලිම් පුරුෂයෙකු ක්වාසි කෙනෙකු මෙන් පත්කිරීමට ඇමතිවරයාට පිළිවන.

(2) 13වෙනි හෝ 14වෙනි වගන්තිවලින් පෙන්වා තිබෙණ අඥමට හැර අන්‍ය අවස්ථාවලදී එකම ප්‍රදේශයකට ක්වාසිවරුන් එක්කෙනෙකුට වැඩි ගණනක් පත් නොකළ යුතුය. ක්වාසිවරුන් පත්කිරී

මේදී එක් එක් ක්වාසිකෙනෙකුගේ ප්‍රදේශය එබඳු වෙනත් ප්‍රදේශයක් සමග එක්වීම හෝ එබඳු වෙන ප්‍රදේශයකින් කොටසක් ඇතුළත්වීම හෝ වැලකෙන පරිදි එම ප්‍රදේශයේ සීමා නියමකිරීම හෝ ලකුණුකිරීම හෝ කළ යුතුය.

(3) සෑම ක්වාසිකෙනෙකු පත්කිරීමක්ම ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කළ යුතුය.

(4) ක්වාසිකෙනෙකු පත්කිරීම සඳහා ප්‍රසිඬකරනුලබන නිවේදනයෙහි ඔහු පත්කරනලද්දේ කුමන ප්‍රදෙශයක් සඳහාද යන්න සඳහන් කළ යුතුය.

(5) සෑම ක්වාසිකෙනෙක්ම තමා පත්කරනු ලැබූ ප්‍රදේශය තුළ පදිංචිව සිටිය යුතුය.

(6) ගැසට් පත්‍රයෙහි නිවේදනයක් පළකිරීමෙන් ක්වාසිකෙනෙකුගේ පත්වීම අවලංගු කිරීම සිය අභිමතය පරිදි ඇමතිවරයාට කළ හැකිය.

(7) තමාගේ ධුර කාලය අවසන්වීමට පෙර ඉල්ලා අස්වුවූ විට හෝ ඇමතිවරයා විසින් ඔහුගේ පත්කිරීම අවලංගු නොකළ විටක හෝ සෑම ක්වාසිකෙනෙක්ම, තම පත්කිරීමේදී ඒ සඳහා කරනු ලැබූ නිවේදනයෙහි සඳහන් කාලය තුළ සිය ධුරය දරන්නේය.

13. යම්කිසි ප්‍රදේශයක් සඳහා පත්කරනු ලැබූ ක්වාසි කෙනෙකු එම ප්‍රදේශය තාවකාලිකව අත්හැර ගියවිට හෝ අසනීපයකින් නැතහොත් අන්කිසි හේතුවකින් මෙම පනත යටතේ තමාගේ යුතුකම් ඉටුකිරීමට තාවකාලිකව නුපුළුවන්වූ විටක හෝ ඒ ප්‍රදේශය සඳහා තාවකාලික ක්වාසිකෙනෙකු මෙන් වැඩබැලීමට සුදුසු කෙනෙකු පත්කිරීමට ඇමතිවරයාට පිළිවන. තාවකාලික ක්වාසිවරු.

එසේවූවද, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ ක්වාසිකෙනෙකු පත්කිරීමේදී එය තිස් දවසකට වැඩිනොවන කාලයක් සඳහා වූ විට, එම පත්කිරීම රිජිස්ට්‍රාර් ජනරාල්තැනට කළ හැකිය.

14. (1) 12වෙනි හෝ 13වෙනි වගන්තිය හැර, ක්වාසි කෙනෙකු පත්කිරීමට විශෙෂ වුවමනාවක් ඇතිවූවිට යහපත් චරිතයකින්ද, තත්ත්වයකින්ද යුත් සුදුසු තනතුරක් දරන මුස්ලිම් පුරුෂයකු විශෙෂ ක්වාසි කෙනෙකු මෙන් පත්කිරීමට ඇමතිවරයාට නිත්‍යානුකූලව පිළිවන. විශෙෂ ක්වාසිවරු.

(2) මුලු දිවයිනට හෝ එහි විශෙෂ ප්‍රදේශයකට හෝ මෙම වගන්තිය යටතේ විශෙෂ ක්වාසිකෙනෙකු පත්කළ හැකිය.

(3) විශෙෂ ක්වාසි කෙනෙකු පත්කිරීමේදී මෙම පනත යටතේ ඔහු විසින් සිය යුතුකම් ඉටුකිරීම හා සිය කටයුතු කිරීමද කළ යුත්තේ කුමන නියමවලට හා සීමාවලට යටත්ව ද යන්න නියම

කිරීමට ඇමතිවරයාට පිළිවන. තවද ඉහත සඳහන් නියමවලට හා සීමාවලට එකඟ නොවන පරිදි එබඳු කිසි කෙනෙකු ක්‍රියා නොකළ යුතුය.

(4) සෑම විශෙෂ ක්වාසි කෙනෙකුගේ පත්කිරීමක්ම ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කළ යුතුය.

(5) ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කරනලද නිවේදනයකින්, විශෙෂ ක්වාසිකෙනෙකුගේ පත්වීම තම අභිමතය පරිදි අවලංගු කිරීමට ඇමතිවරයාට පිළිවන.

ක්වාසි මණ්ඩලය.

15. (1) මෙම පනත යටතේ ක්වාසිවරුන් විසින් කරනු ලබන තීරණවලට විරුඬව ගන්නාලද ඇපැල් විභාගකිරීම පිණිස, දිවයිනෙහි පදිංචිව සිටින, යහපත් චරිතයකින් හා තත්ත්වයකින් යුක්තවූද සුදුසු තනතුරු දරන්නාවූද මුස්ලිම් පුරුෂයින් පස් දෙනෙකුගෙන් යුත් ක්වාසි මණ්ඩලයක් පත්කිරීමට ඇමතිවරයාට පිළිවන.

(2) ක්වාසි මණ්ඩලයේ සභිකවරුන් පත්කිරීම ගැසට් පත්‍රයේ නිවේදනයකින් ප්‍රසිඬ කළ යුතුය.

(3) (අ) ක්වාසි මණ්ඩලයේ ගණපූරණය තුන්දෙනෙක් විය යුතුය.

(ආ) මෙම ගණපූරණය නොමැති අවසථාවකදී ක්වාසි මණ්ඩලය විසින් කිසිම ඇපැලක් නොඇසිය යුතුය.

(ඉ) ක්වාසි මණ්ඩලය විසින් ඇපැලක් ඇසීමේදී එහි පැමිණ සිටි සභිකයන් වැඩිදෙනාගේ තීරණය සෑම කරුණක් සඳහාම මණ්ඩලයෙහි තීරණය ලෙස සලකනු ලැබේ.

(4) විශෙෂ අවසථාවලදීද, ඒ සඳහා රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ ඉල්ලීමක් ඇතිවූ විට ද ක්වාසි මණ්ඩලයේ සභිකයෙකුගේ පත්කිරීම අවසන්කිරීම ගැසට් පත්‍රයෙහි නිවේදනයක් පළ කිරීමෙන් ඇමතිවරයාට කළ හැකිය.

(5) ක්වාසි මණ්ඩලයේ සභිකයෙකු පත්කිරීම ඇමතිවරයා විසින් අවසන්කළ විට හෝ එබඳු සභිකයෙකු මරණයට පත්වූවිට හෝ සිය ධුරයෙන් ඉල්ලා අස්වූවිටක හෝ රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ අවසරය නොමැතිව තුන් මාසයකට වැඩි කාලයක් දිවයිනෙන් පිටත ගොස් සිටි විට හෝ එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසු කෙනෙකු පත්කිරීමට ඇමතිවරයාට පිළිවන.

(6) ක්වාසි මණ්ඩලයේ ලේකම් ධුරයට හෝ එම ධුරයෙහි වැඩ බැලීමට හෝ යමෙකු පත්කිරීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පිළිවන. මෙම පනතේ විධිවිධානවලින්ද ඒ යටතේ සම්පාදිත නියෝග අනුවද, එබඳු විධිවිධානවලට විරුඬ නොවන අන්දමේ ක්වාසි මණ්ඩලයේ තීරණයක් අනුවද පවරනු ලබන සියලු යුතුකම් ඉටුකිරීමද කටයුතු කිරීමද එසේ පත්කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම වන්නේය.

## II වෙනි කාණ්ඩය

### විවාහ ලියා පදිංචිකිරීම

**16.** යම්කිසි මුස්ලිම් විවාහයක් හෝ දික්කසාදයක්, එම විවාහයට හෝ දික්කසාදයට ඇතුළත්වූ දෙපාර්ශවයේ නිකාය පාලනය කරන මුස්ලිම් නීතිය අනුව වලංගුව හෝ අවලංගුව තිබේනම් එකී විවාහය හෝ දික්කසාදය ලියා පදිංචිකිරීම හෝ නොකිරීම පමණකින්ම එය වලංගුවීමට හෝ අවලංගුවීමට මෙම පනතෙහි සඳහන් කිසිවක් හේතුවත්නාක්මෙන් තේරුම් නොගතයුතුය. මුස්ලිම් විවාහ වලංගුවීම හෝ අවලංගුවීම.

17. (1) මින්මතු පැහැදිලි ලෙස අන් අන්දමකින් පෙන්වා නොමැතිවිටක හැර, අන්‍ය අවස්ථාවලදී මෙම පනත ක්‍රියාවේ යෙදවීමට පසුව මුස්ලිම්වරුන් අතර කරගන්නාලද සෑම විවාහයක්ම, එයට සම්බන්ධවූ "නිකා" චාරිත්‍රය අවසානවූ වහාම මෙහි පහත පෙන්වා තිබෙණ පරිදි ලියා පදිංචි කළයුතුය. විවාහය ලියා පදිංචි කරවීමේ යුතුකම.

(2) එබඳු එක් එක් විවාහයක් පිළිබඳව එය ලියා පදිංචිකරවීමේ යුතුකම එම විවාහයට සම්බන්ධවූ පහත සඳහන් අය වෙත මෙසින් පවරනු ලැබේ. එනම්:—

(අ) මනාලයා;

(ආ) 47වෙනි වගන්තිය යටතේ "වාලි" කෙනෙකුගේ කැමැත්ත ගතයුතුව තිබී, එයින් ඔහු නිදහස් නොකරන ලදුව මනාලිය අයිති නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය අනුව එකී කැමැත්ත අවශ්‍යවිට එකී "වාලි" සහ

(ඉ) විවාහය සම්බන්ධ "නිකා" චාරිත්‍ර කළ අය ද වෙත්.

(3) විවාහය ලියා පදිංචිකරවීම සඳහා 2 වෙනි උප වගන්තියේ සඳහන් අය විසින් පහත දැක්වෙන යුතුකම් ඉෂ්ට කළ යුතුය:—

(අ) "නිකා" චාරිත්‍රය කළයුතු දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ තොරතුරු ලේකම්තැනට සැපයීම සහ විවාහය ලියා පදිංචි කිරීම සඳහා එකී චාරිත්‍රය පැවැත්වීමට පැමිණෙන ලෙස ඉල්ලීම; සහ

(ආ) "නිකා" චාරිත්‍රය අවසානවූ වහාම විවාහය ලියා පදිංචි කරන ලෙස ලේකම්තැනගෙන් ඉල්ලීම සහ ඒ සඳහා අවශ්‍ය සියලු උපකාර කිරීම හා අනිකුත් සියලු කටයුතු සැලැස්වීමද වේ.

(4) 3වෙනි උප වගන්තිය යටතේ කළ යුතු සියලු කටයුතු කිරීමෙන් පසුවද විවාහය ලියා පදිංචි කිරීම ලේකම්තැන විසින් පැහැර හරින විට හෝ එසේ කිරීමට බැරියයි කියන විට ද, "නිකා" චාරිත්‍රය පසුවී දවස් 7ක් ඇතුළතදී විවාහය සම්බන්ධ පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් දිස්ත්‍රික් ලේකම්තැන වෙත ලියා යැවීම 2වෙනි උප වගන්තියේ සඳහන් අයගේ යුතුකම වන්නේය.—

(අ) විවාහයේ පාර්ශවකාරයින්ගේ නම්;

(ආ) "නිකා" චාරිත්‍රය කරන්ට යෙදුන දිනය, වේලාව සහ ස්ථානය ;

(ඉ) "වාලි" කෙනෙකු සිටියේ නම් ඔහුගේ නම ; සහ

(ඊ) "නිකා" චාරිත්‍රය කළ තැනැත්තාගේ නම ද වේ.

(5) මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන අනුව ඒ ඒ අය විසින් කළයුතු කටයුතු නොකිරීමේ හේතුවෙන් මෙම පනත යටතේ ලියා පදිංචි කළයුතුවූ විවාහයක් ලියා පදිංචි නො කළ විට, එකී එක් එක් අය විවාහය ලියා පදිංචි නොකරවූ තැනැත්තන් ලෙස සැළකිය යුතුය.

(6) විවාහයක් ලියා පදිංචි නොකරවීමේ වරදට හෝ විවාහයක් ලියා පදිංචිකිරීම ලේකම්තැන විසින් පැහැර හරිනු ලැබූ විට නොහොත් ලියා පදිංචි කිරීමට බැරියයි කියන විට, ඒ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්තැන වෙත වාර්තාවක් සැපයීමට නොහැකිවීමේ වරදට හෝ යම් කෙනෙකු වරදකාරයා කරන උසාවියක් විසින් එකී වරද පිළිබඳ නඩු විභාගය අවසන්වීමෙන් පසු හැකි පමණ ඉක්මණින් විවාහය පිළිබඳව 4වෙනි උප වගන්තිය අනුව අවශ්‍ය විස්තර අඩංගු වාර්තාවක් දිස්ත්‍රික් ලේකම්තැනට යැවියයුතුය.

(7) 4වෙනි හෝ 6වෙනි උප වගන්ති යටතේ යම්කිසි වාර්තාවක් ලැබුණු දිස්ත්‍රික් ලේකම්කෙනෙකු විසින්, විවාහය සිදුවී තිබෙණ නමුත් එය ලියා පදිංචි නොකිරීම සම්බන්ධයෙන් සුදුසු අන්දමේ විභාගයක් පවත්වා එය පිළිගැනීමද වාර්තාවේ සඳහන් විස්තර නිවැරදිදැයි පරීක්ෂාකොට වැරදි සහිත නම් එය සංශොධනය කිරීමද එසේ නිවැරදි කරනු ලැබූ නොහොත් සංශොධනය කරනු ලැබූ විස්තර සහිතව එකී විවාහය ලියා පදිංචි කිරීමට නියෝගයක් කිරීමද කළයුතුය. එවිට එකී නියෝගයෙහි නම සඳහන් ලේකම්තැන විසින් එපරිද්දෙන් ඒ විවාහය ලියා පදිංචි කළයුතුය.

ප්‍රකාශය සහ ලියා පදිංචි කිරීමේ ආකෘතිය.

18. (1) විවාහයක් ලියා පදිංචිකිරීමට ප්‍රථම, ඉංග්‍රීසියෙන් හෝ දෙමළෙන් හෝ සිංහලෙන් හෝ ලේකම් ඉදිරියේ පහත දැක්වෙන අන්දමේ ප්‍රකාශයක් කොට අත්සන් කළයුතුය.—

(අ) පළමුවෙනි උපලේඛනයෙහි සඳහන් දෙවෙනි ආකෘතියට සාරානුකූලව මනාලයා විසින් කරනු ලබන ප්‍රකාශයක් හා

(ආ) එකී උපලේඛනයෙහි සඳහන් තුන්වෙනි ආකෘතියට සාරානුකූලව මනාලියගේ "වාලි" විසින් කරනු ලබන ප්‍රකාශයක්ද වේ.

එසේදවුවත්, 47 වෙනි වගන්තිය යටතේ "වාලි" කෙනෙකුගේ කැමැත්ත නුවුවමනා විට ද නැතහොත් මනාලිය අයත් නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය අනුව "වාලි" කෙනෙකු අනවශ්‍ය විට ද "වාලි" කෙනෙකුගේ ප්‍රකාශය නුවුවමනාය. තවද ප්‍රකාශය කරන

"වාලි", මනාලියගේ පියා හෝ පිය පක්ෂයේ මුත්තා හෝ නොව අනිකෙකුවූ විට "වාලි" විසින් කරනලද ප්‍රකාශය මනාලිය විසින්ද අත්සන් කළයුතුය.

මනාලයාටද ඉහත සඳහන් විධිවිධාන අනුව අවශ්‍යවූ විට "වාලිට" සහ මනාලියටද එබඳු ප්‍රකාශ අත්සන්කිරීමට නියම කිරීම ලේකම් තැනගේ යුතුකම වන්නේය.

(2) 1වෙනි උප වගන්තියෙහි සඳහන් ප්‍රකාශයන් අත්සන් කිරීමෙන් පසු විවාහය පිළිබඳ විස්තර ඇතුළත් ප්‍රකාශයක් විවාහ ලේකම් පොතෙහි ඉංග්‍රීසියෙන් හෝ දෙමළෙන් හෝ සිංහලෙන් හෝ මුල් පත්‍ර, උප පත්‍ර ක්‍රමයට සටහන් කිරීම ලේකම්තැන විසින් කළ යුතුය. එකී ලේකම් පොත පළමුවෙනි උපලේඛනයෙහි සඳහන් 4 වෙනි ආකෘතියට සාරානුකූලව ඒ සඳහා තැබීමට මෙයින් නියම කරනු ලැබේ.

(3) නියමිත ගාස්තුව, මනාලයා විසින් මුද්දර සැපයීමෙන් ගෙවිය යුතුය. එබඳු මුද්දර මින්මතු "දෙවෙනි පිටපත" යන්නෙන් හඳුන්වන විවාහ සටහනෙහි මුල් පත්‍රයට අලවා ලේකම්තැන විසින් යථාපරිදි අවලංගු කළයුතුය.

***විවාහ පිළිබඳ සටහන් අත්සන් කොට සහතික කළ යුතු බව.***

**19.** (1) එක් එක් විවාහය සම්බන්ධව ලේකම් පොතෙහි ඇතුළත් කරනලද විස්තර ප්‍රකාශයෙහි මුල් පත්‍රය හා උප පත්‍රය පහත සඳහන් අය විසින් අත්සන් කළයුතුය:—

(අ) මනාලයා ;

(ආ) 47 වෙනි වගන්තිය යටතේ "වාලි" කෙනෙකුගේ කැමැත්ත අත්හැර නොදමනලදුව මනාලිය අයත් නිකාය පාලනය කරන මුස්ලිම් නීතිය අනුව එබඳු වාලි කෙනෙකු වුවමනා විට මනාලියගේ "වාලි" ;

(ඉ) විවාහය සම්බන්ධවූ "නිකා" චාරිත්‍රය පැවැත්වූ තැනැත්තා ;

(ඊ) "නිකා" චාරිත්‍රය සිදු කිරීමේදී පැමිණ සිටි සාක්ෂිකරුවන් දෙදෙනෙක් සහ ලේකම්තැනද වෙත්.

(2) යම්කිසි විවාහයක "නිකා" චාරිත්‍රය ලේකම්තැන විසින්ම පවත්වා තිබෙණ විට ලේකම් පොතෙහි "නිකා" චාරිත්‍රය පවත්වන අයගේ අත්සන සඳහා වෙන්කර තිබෙණ ස්ථානයෙහි "මුස්ලිම් විවාහ ලේකම්තැන" යන වචන යොදා ලේකම් වශයෙන් අත්සන් කිරීම ප්‍රමාණවත් වන්නේය.

***විවාහ ලියා පදිංචි කොට පිළිවෙළින් අංක කළ යුතු බව.***

**20.** මෙම පනත යටතේ ලියා පදිංචි කළයුතු විවාහ එක් එක් ලේකම්තැන විසින් ඒ සඳහා තබා තිබෙන ලේකම් පොතෙහි.—

(අ) පළමුවෙනි විවාහය පළමුවෙනි පිටෙන් පටන්ගෙන එක් එක් විවාහයක් වෙන වෙනම පිටක ඇතුළත් කළයුතුය ; තවද

(ආ) එම විවාහය ලියා පදිංචිකිරීම පිණිස ලේකම්වරුන්ට දැන්වූ වේලාවේ පිළිවෙළට එම ලේකම් පොතෙහි ඒවාට පිළිවෙළින් අංක යෙදිය යුතුය.

විවාහයේදී ලේකම්ගේ පැමිණීම.

**21.** යම් ප්‍රදේශයක මුස්ලිම්වරුන් අතර සිදුවන විවාහයක් ලියාපදිංචිකිරීම සඳහා පැමිණෙන ලෙස මනාලයා විසින් හෝ මනාලියගේ "වාලි" විසින් හෝ "නිකා" චාරිත්‍රය පවත්වන තැනැත්තා විසින් හෝ ඉල්ලා සිටි විට එම ප්‍රදේශය වෙනුවෙන් 8වෙනි හෝ 9වෙනි වගන්තිය යටතේ පත්කරනු ලැබූ ලේකම් කෙනෙක් එකී විවාහය සිදුකිරීම සඳහා පැමිණිය යුතුය.

එසේවූවද මෙම පනතෙහි හෝ ඒ යටතේ සාදනලද නියෝගවලට හෝ විධිවිධානවලට විරුඬව යම්කිසි විවාහයක් සිදුකිරීමට බැරියයි කීමට ලේකම්කෙනෙකුට ඇති බලයට මෙම වගන්තියේ ඉහත සඳහන් කිසිවකින් වෙනසක් වන්නා සේ තේරුම් නොගතයුතුය.

තවද ඉහත සඳහන් පරිදි එකම වේලාවෙහිදී හෝ එකම දිනයෙහිදී හෝ විවාහ සිදුකිරීමට ස්ථාන දෙකකට හෝ වැඩි ගණනකට පැමිණීමට ලේකම් කෙනෙකුගෙන් ඉල්ලා සිටියහොත් එබඳු විවාහයකින් එකක් පිළිබඳව වේලාව හෝ දිනය වෙනස් කිරීමට ඔහුට බලය තිබේ ; නැතහොත්, එසේ වෙනස්කිරීමට නුපුළුවන්වූ විට එබඳු විවාහවලින් එකකට හෝ වැඩි ගණනකට හෝ පැමිණීමට බැරියයි කීමටද ඔහුට බලය තිබේ.

"ඉද්දත්" කාලය තුළදී විවාහයක් ලියා පදිංචි නොකළයුතු බව.

**22.** 17වෙනි වගන්තියෙහි කෙසේ සඳහන්වී තිබෙණ නමුදු "ඉද්දත්" කාලයක් තුළදී මුස්ලිම් ස්ත්‍රියක විසින් කරගන්නාලද විවාහය මෙම පනත යටතේ ලියා පදිංචි නොකළ යුතුය.

දෙලොස් විය නොපැමිණි බාලිකාවකගේ විවාහය ක්වාසිගේ අවසරය නොමැතිව ලියා පදිංචි නොකළ යුතු බව.

**23.** 17වෙනි වගන්තියෙහි කෙසේ සඳහන්වී තිබෙණ නමුදු මුස්ලිම් බාලිකාවක් පදිංචිව සිටින ප්‍රදේශයෙහි ක්වාසි කෙනෙකු විසින්, ඔහුට අවශ්‍ය ලෙස සලකන අන්දමේ විභාගයක් පවත්වා විවාහය ලියා පදිංචි කිරීමට බලය දුන් විටක විනා, එම ප්‍රදේශයෙහි සිටින දෙලොස්විය නොපිරුණු බාලිකාවකගේ විවාහය මෙම පනත යටතේ ලියා පදිංචි නොකළ යුතුය.

දෙවෙනි වරට හෝ ඊට පසුව කරගන්නා විවාහය.

**24.** (1) භාර්‍යාවන් එක්කෙනෙකු හෝ ඊට වැඩි ගණනක් ඇති නැතහොත් පොෂණය කරන, විවාහක මුස්ලිම් පුරුෂයෙකු තව විවාහයක් කරගැනීමට අදහස්කර සිටිනවිට එම විවාහය සිදුකිරීමට යටත් පිරිසෙයින් දින තිහකට පෙර තමා පදිංචිව සිටින ප්‍රදේශයෙහි ක්වාසිතැනට තමාගේ අදහස පිළිබඳව දැන්වීමක් කළයුතුය ; ඔහුගේ භාර්‍යාව හෝ එක් එක් භාර්‍යාව පදිංචි ප්‍රදේශයේ ක්වාසිතැනට හෝ ක්වාසිවරුන්ටද, තමා විවාහකර ගැනීමට බලාපොරොත්තුව සිටින ස්ත්‍රිය පදිංචිව සිටින්නාවූ ප්‍රදේශයෙහි ක්වාසි තැනටද, එපරිද්දෙන්ම දැනුම් දියයුතුය.

(2) 1වෙනි උප වගන්තිය අනුව කළයුතු සෑම දැන්වීමක්ම නියමිත ආකෘතිය අනුව වියයුතුය. තවද දැන්වීම කරන්නාගේද ඔහුගේ භාර්‍යාවගේ නැතහොත් එක් එක් භාර්‍යාවගේද අලුතෙන් විවාහ කරගැනීමට බලාපොරොත්තුව සිටින ස්ත්‍රියගේද සම්පූර්ණ නම් සහ ලිපිනය එහි ඇතුළත් වියයුතුය.

(3) 1වෙනි උප වගන්තිය යටතේ දෙනුලැබූ දැන්වීමක් ලැබුණු එක් එක් ක්වාසිතැන විසින්, එම දැන්වීමේ පිටපතක් තමාගේ ප්‍රදේශයෙහි පිහිටි එක් එක් ජුම්මා පල්ලියකද තමාගේ ප්‍රදේශයෙහි පිහිටි ඉහතකී දැන්වීමෙහි සඳහන් කරනලද එක් එක් ලිපිනයේ සඳහන් ප්‍රකට ස්ථානයකද ප්‍රදර්ශනය කළයුතුය.

(4) 17වෙනි වගන්තියෙහි කෙසේ සඳහන්ව තිබෙණ නමුදු (1) වෙනි උප වගන්තිය යටතේ කළයුතු පරිදි දැන්වීම් නොකිරීමෙන් එම වගන්තියෙහි විස්තර කරනුලැබූ මුස්ලිම් පුරුෂයෙකු විසින් කරගන්නාලද විවාහයක් මෙම පනත යටතේ ලියා පදිංචිකරනු නොලැබේ.

**25.** (1) පහත සඳහන් කටයුතු නොකළ විටකදී ෂාෆි නිකායට අයත් ස්ත්‍රියකගේ විවාහ ගිවිසගැනීමත් එම නිකායට අදාළවන නීතිය අනුව වලංගුනොවන බව සැක දුරුකිරීම පිණිස මෙසේ ප්‍රකාශ කරනු ලැබේ :— ෂාෆි නිකායට අයත් ස්ත්‍රීන්ගේ විවාහ පිළිබඳ ප්‍රකාශය.

(අ) ස්ත්‍රියගේ "වාලි" කෙනෙකු ලෙස ක්‍රියාකිරීමට බලය ඇති කෙනෙක්—

(i) ගිවිසුම කරගන්නාලද ස්ථානයට එකී වේලාවේදී පැමිණීම ; සහ

(ii) ගිවිසුම ගැන ස්ත්‍රියගේ කැමැත්තද තමාගේ අනුමතියද දැන්වීම ; නැතහොත්

(ආ) 47 වෙනි වගන්තිය යටතේ ක්වාසිකෙනෙකු විවාහයට බලයදී "වාලි" කෙනෙකු පැමිණීමේ අවශ්‍යතාවය හා ඔහුගේ අනුමතිය අත්හැර දැමීමය.

(2) 1වෙනි උප වගන්තියේ සඳහන් නීතිය අනුව වලංගු නොවන විවාහයක් මෙම පනත යටතේ ලියා පදිංචිකරනු නොලැබේ.

**26.** (1) මනාලිය අයත් නිකාය පාලනය කරන මුස්ලිම් නීතිය අනුව ඇ වෙනුවෙන් "වාලි" කෙනෙකු ලෙස කටයුතු කිරීමට බලය නැති කිසිවකු මුස්ලිම් ස්ත්‍රියකගේ විවාහයකදී "වාලි" කෙනෙකු ලෙස දැනුවත්ව ක්‍රියා නොකළ යුතුය. මනාලියගේ වාලි.

(2) 1වෙනි උප වගන්තියේ විධිවිධානවලට විරුඬව යමෙකු වාලිකෙනෙකු ලෙස ක්‍රියා කරනලද විවාහයක් මෙම පනත යටතේ ලියා පදිංචිකරනු නොලැබේ.

## III වෙනි කාණ්ඩය

### දික්කසාද ලියා පදිංචිකිරීම

**27.** සිය භාර්‍යාව දික්කසාද කිරීමට ස්වාමි පුරුෂයෙකු කැමතිව සිටින විට දෙවෙනි උපලේඛනයෙහි සඳහන් ක්‍රියා පරිපාටිය අනුගමනය කළයුතුය. ස්වාමි පුරුෂයා විසින් දික්කසාද කිරීම.

භාර්යාව විසින් දික්කසාද කිරීම.

28. (1) ගිරිහැරකිරීම නිසා හෝ පාර්ශවකාරයන් අයත් නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය යටතේ යම් ක්‍රියාවක් කිරීමෙන් හෝ නොකිරීමෙන් හෝ "දෙෂයක්" වන යමක් ස්වාමි පුරුෂයා විසින් කිරීම හෝ නොකිරීම නිසා හෝ ඔහුගේ කැමැත්ත නැතිව ඔහුගෙන් දික්කසාදවීමට කැමතිව සිටින භාර්යාවක විසින් තුන්වෙනි උපලේඛනයෙහි සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කළයුතුය.

(2) පාර්ශවකාරයින් අයත් නිකාය පාලනයකරන මුස්ලිම් නීතියෙන් භාර්යාවකට අවසරදී තිබෙන අන්‍ය දික්කසාදයක් වන්නාවූ එහෙත් 1වෙනි උප වගන්තිය යටතේ සඳහන්කරනු නොලැබූ කරුණක් අනුව භාර්යාවක් ඇයගේ ස්වාමිපුරුෂයාගෙන් දික්කසාදවීමට කැමතිව සිටින විට එකී එක් එක් දික්කසාදයේ අන්දමට තුන්වෙනි උපලෙඛනයේ සඳහන් ක්‍රියා පරිපාටිය අනුගමනය කළයුතු හෝ කළහැකි අන්දමට එය අනුගමනය කළයුතුය.

දික්කසාද ලියා පදිංචි කිරීම.

29. (1) දෙවන උපලෙඛනය අනුව දික්කසාදයක් ලියා පදිංචි කළයුතු ක්වාසිකෙනෙකු විසින් එම දික්කසාදය පිළිබඳ විස්තර ප්‍රකාශයක් ඉංග්‍රීසියෙන් හෝ දෙමළෙන් හෝ සිංහලෙන් මුල් පත්‍ර, උප පත්‍ර අනුව දික්කසාද ලේකම් පොතක ඇතුළත් කළයුතුය. එකී ලේකම් පොත මෙහි පළමුවෙනි උපලෙඛනයෙහි සඳහන් පස්වෙනි ආකෘතියට සාරානුකූලව ඒ සඳහා තැබීමට ඔහුට මෙයින් නියමකරනු ලැබේ.

(2) දික්කසාදයක් පිළිබඳව දික්කසාද ලේකම් පොතෙහි ඇතුළත් කරනලද සටහන්වල මුල් පත්‍ර හා උප පත්‍ර ක්වාසි විසින්ද සටහන් සාදන වේලාවෙහිදී ස්වාමිපුරුෂයා සහ භාර්යාව පැමිණ සිටි විටකදී නම් ඔවුන් විසින්ද අත්සන් කළයුතුය.

(3) 1වෙනි උප වගන්තිය යටතේ ලියා පදිංචි කළයුතු දික්කසාද එක එක් ක්වාසිතැන විසින් ඒ සඳහා තබා තිබෙණ ලේකම් පොතෙහි :—

(අ) පළමුවෙනි දික්කසාදය පළමුවෙනි පිටෙන් පටන්ගෙන එක් එක් දික්කසාදයක් වෙන වෙනම ඇතුළත් කළයුතුයි; තවද

(ආ) එම දික්කසාද ලියා පදිංචිකිරීම පිණිස ක්වාසිවරුන්ට දුන්වූ වේලාවේ පිළිවෙළට එම ලේකම් පොතෙහි ඒවාට පිළිවෙළින් අංක යෙදිය යුතුයි.

(4) දික්කසාදය පිළිබඳ නඩුව ආරම්භකළ වහාම දික්කසාදයක් ඉල්ලා සිටින පක්ෂය විසින් ක්වාසිතැනගේ නියමිත ගාස්තුව ඔහුට ගෙවිය යුතුය. නියමිත ගාස්තුව ගෙවිය යුත්තේ මුද්දරවලිනි. තවද එකී මුද්දර දික්කසාද පිළිබඳ සටහන්වල මින්මතු "දෙවෙනි පිටපත" නමින් හඳුන්වන මුල් පත්‍රයෙහි අලවා ක්වාසිතැන විසින් යථා පරිදි අවලංගු කළ යුතුය.

## IV වෙනි කාණ්ඩය

## කලින් සිදුකරනලද දික්කසාද සඳහාද නැවත සිදුකරන විවාහ සඳහාද විශෙෂ විධිවිධාන

දික්කසාද ඔප්පු කිරීමට ඇති සාක්ෂි ප්‍රමාණ වත් නොවන අවස්ථාවලදී දික්කසාද ලියා පදිංචි කරන ක්‍රමය.

30. මෙම පනත යටතේ ක්වාසි කෙනෙකු ඉදිරියේ විභාග වන නඩුවකදී, මෙම පනත ක්‍රියාවෙහි යෙදවීමට ප්‍රථම හෝ පසුව තමා විසින් සිය භාය්‍යාව දික්කසාද කරනලදැයි යම් මුස්ලිම් පුරුෂයෙකු කියා සිටින විට, එකී දික්කසාදය ඇත්ත වශයෙන්ම සිදුකරනලදැයි ඔප්පු කිරීමට නොහැකි වුවහොත් එකී නඩුවේදී පුරුෂයා විසින් කරනලද ප්‍රකාශය මුස්ලිම් නීතිය යටතේ "තලක්" ප්‍රකාශයක් මෙන් සලකා එය දෙවෙනි උපලෙඛනයේ ව්‍යවස්ථා යටතේ සටහන් කළ යුතුය. එවිට, "තලක්" ප්‍රකාශය කිරීමෙන් පසුව අනුගමනය කළ යුතු කාය්‍ය පරිපාටිය පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් විධිවිධාන ඒ අවස්ථාව සඳහාද සුදුසු වෙනස්කම් සහිතව අදාළවන්නේය.

එසේ වුවද, එබඳු අවස්ථාවකදී ඉහතකී පරිදි "තලක්" ප්‍රකාශය සටහන් කිරීමෙන් මාසතුනක කාලයක් ගතවීමට ප්‍රථම දික්කසාදය ලියා පදිංචි කරනු නොලැබේ; නැතහොත් එකී කාලය ගතවීමේදී භාය්‍යාව ගැබ් උසුලමින් සිටිනම් දරු උපත සිදුවන තෙක් එය ලියා පදිංචි නොකළ යුතුය.

දික්කසාදයක් හෝ නැවත විවාහවීමක් ලියා පදිංචි කිරීමේ ප්‍රතිඵල.

31. මෙම පනතෙන් අවලංගු කරනලද පැරණි පනතෙහි 23 වෙනි වගන්තියෙන් අවශ්‍ය අනුමට යථාපරිදි ලියා පදිංචි කරනලද දික්කසාදයක් හෝ නැවත විවාහවීමක් එකී දික්කසාදය නැතහොත් විවාහය පළමුවෙන් සිදුකරනලද දිනයේදී සිදුකරන ලද්දක් ලෙසම බල පවත්වන ලෙස සැළකිය යුතුය. එබඳු නැවත විවාහවීමකින් ලබනලද දරුවන් එකී නැවත විවාහයෙන් ලත් සුජාත දරුවන් ලෙස සළකනු ලැබේ.

ලියා පදිංචි නොකර හරිනලද විවාහ හා දික්කසාද ලියා පදිංචි කිරීමට ඇති බලය සහ වැරදිලෙස ලියා පදිංචි කිරීම් නිවැරදි කිරීම.

32. (1) 1937තේ ජනවාරි මස පළමුවෙනිද හෝ ඊට පසුව සිදු කරනලද විවාහයක් නැතහොත් දික්කසාදයක් ලියා පදිංචි නොකර තිබෙණ විටද නැතහොත් වැරදි විස්තර සහිතව ලියා පදිංචිකර තිබෙන විටද එකී විවාහයේ නැතහොත් දික්කසාදයේ පාර්ශවකාරයින් හෝ ඔවුන්ගෙන් කෙනෙකු නැසීගොස් තිබෙණ විට එම පාර්ශවකාරයින්ගේ දරුවෙකුට හෝ නැතහොත් ඔහු වෙනුවෙන් නීත්‍යනුකූලව පෙනී සිටින්නෙකුට හෝ එකී විවාහය නැතහොත් දික්කසාදය ලියා පදිංචිකරන ලෙස නැතහොත් වැරදි ලෙස ලියා පදිංචි කර තිබෙණ විස්තර නිවැරදි කරන ලෙස හෝ එම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තැන වෙත ඉල්ලීමක් කළ හැකිය. එබඳු ඉල්ලීමක් ලත් දිස්ත්‍රික් ලේකම්තැන විසින් ඉහතකී අනුමේ විවාහයක් නැතහොත් දික්කසාදයක් සිදුකළ පූජක තැනට හෝ ලේකම්තැනට හෝ ක්වාසිතැනට සහ තමා යොග්‍යයයි සළකන අන් කෙනෙකුටද එම ඉල්ලීමට ඉඩ නොදියයුතු කාරණා ඇතොත් පෙන්වන ලෙස නියමකරන දැන්වීමක් භාරකරවිය යුතුය.

එකී ඉල්ලීමට විරුඬව සැහෙන කරුණු නොපෙන්වුවහොත්, ඉදිරිපත් කරන සාක්ෂ්‍යද අසා, එබඳු විවාහයක් හෝ දික්කසාදයක් ඇත්තවශයෙන්ම සිදුකර තිබෙන නමුත් එය ලියා පදිංචිකර නොතිබේයයිද නැතහොත් වැරදි විස්තර සහිතව ලියා පදිංචිකර තිබේයයිද දිස්ත්‍රික් ලේකම්තැන පිළිගත් විට එබඳු විවාහයක් හෝ දික්කසාදයක් ලියා පදිංචි කරන ලෙසද නැතහොත් වැරදි විස්තර සහිතව ලියා පදිංචි කර තිබේ නම් එය නිවැරදි කරන ලෙසද අවස්ථානුකූල පරිදි, තමන්ගේ අත්සන යටතේ නියෝගයක් නිකුත් කිරීමෙන් නියම කළ යුතුය.

(2) 1වෙනි උප වගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමකට ඊට නියමිත මුද්දර, ඉල්ලුම්කරු විසින් සැපයිය යුතුය.

ලියා පදිංචි කිරීමේ වැරදි නිවැරදි කිරීම.

33. නැවත විවාහවීමක් හෝ දික්කසාදයක් සම්බන්ධයෙන් ඇතිවී තිබෙණ යම්කිසි වැරදි විස්තරයක් නිවැරදි කිරීම සඳහා 32වෙනි වගන්තියෙන් දිස්ත්‍රික් ලේකම් කෙනෙකු වෙත පැවරී තිබෙණ බලය රිජිස්ත්‍රාර් ජනරාල්තැනට පාවිච්චිකළ හැකිය.

V වෙනි කාණ්ඩය

## නඩත්තුව "මහාරය" සහ "කයිකූලිය" පිළිබඳ විධිවිධාන

භාර්‍යාවගේ නඩත්තුව පිළිබඳ ඉල්ලීම්.

34. ක්වාසි කෙනෙකුගේ ආඥාවක් අනුව හෝ අන් අඤමකින් හෝ සිය පුරුෂයා සමග වාසයකරන නැතහොත් වාසයකර තිබෙණ කාලයක් සඳහා නඩත්තු මුදලක් ඉල්ලීම හෝ ලබාගැනීම භාර්‍යාවකට හෝ ඇය වෙනුවෙන් පෙනී සිටින කිසිවෙකුට හෝ නීත්‍යනුකූල නොවන්නේය.

දරුවෙකුගේ නඩත්තුව සඳහා ඉල්ලීම.

35. (1) පියා සමග වාසයකරන හෝ වාසයකර තිබෙණ කාලයක් සඳහා නඩත්තු මුදලක් ඉල්ලීම හෝ ලබාගැනීම දරුවෙකුට හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින කිසිවෙකුට හෝ නීත්‍යනුකූල නොවන්නේය.

(2) දරුවෙකුගේ නඩත්තුව සඳහා ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් කරනලද ඉල්ලීමකට ඉඩදෙන අවස්ථාවකදී එකී ඉල්ලීම කරනුලැබූ දිනයේ සිට ඊට ඉඩදෙමින් ආඥාවක් නිකුත්කරන දිනය දක්වා කාලය තුළදී දරුවාගේ ප්‍රයෝජනයට හෝ නඩත්තුව සඳහා හෝ පියා විසින් ගෙවා තිබෙණ යම් මුදලක් ඇති වුවහොත් එය අඩුකළ යුතුය.

ඉල්ලීමක් කරන දිනයේ සිට නඩත්තු මුදල ගෙවීමට කරනු ලබන නියෝග.

36. භාර්‍යාවක විසින් හෝ ළමයෙකු විසින් නැතහොත් එබන්දෙකු වෙනුවෙන් නඩත්තුව සඳහා කරනු ලබන ඉල්ලීමකට ඉඩදෙමින් නියෝගයක් කිරීමේදී එකී නියෝගය, ඉල්ලීම කළ දින සිට බල පැවැත්විය යුතුයයි එම නියෝගයෙහි සඳහන්විය යුතුය; එවිට එකී නියෝගය අනුව ඉල්ලීම කළ දින පටන් නඩත්තු මුදල ගෙවිය යුතුය. මෙය 34වෙනි 35වෙනි වගන්තිවල දැක්වෙන විධිවිධානවලට යටත්ව වියයුතුය.